# 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත

# සහ

# 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන

# ඡන්ද විමසීම් (සංශෝධන) පනත

# පිළිබඳ හැඳින්වීමක්

ශ්‍රීයානී විජේසුන්දර
මංජුල ගජනායක

| | | |
|---|---|---|
| ප්‍රකාශනය | : | විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය |
| පරිගණක පිටු සැලසුම | : | රාජේන්ද්‍රන් ලක්ෂ්මි |
| පිට කවරය | : | සුජිත් කුමාර |


විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදීත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිට වනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජන කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැපවී සිටී.


| | | |
|---|---|---|
| ලිපිනය | : | 24/2, 28 වැනි පටුමඟ |
| | | පිටත මල් පාර, කොළඹ 07. |
| දුරකථන | : | +94 (11) 2565304-6 |
| ෆැක්ස් | : | +94 (11) 4714461 |
| වෙබ් අඩවිය | : | www. cpalanka.org |
| විද්‍යුත් ලිපිනය | : | sriyanie@cpalanka.org |

## 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතට එක්වූ නවතම සංශෝධන පිළිබඳ හැඳින්වීමක්

**ශ්‍රියාණි විජේසුන්දර**

සමාජයක නිසි පාලනය සංස්ථාපනය කිරීමේ පදනම වරට නීති පද්ධතියයි. වෙනස්කම් වලට ලක්වන සමාජයක එම නීති පද්ධතිය ද වෙනස් නොවී පැවතිය නොහැකි අතර වෙනස්වන සමාජමය අවශ්‍යතාවලට අනුව අනුවර්තනය විය යුතුය.

කිසියම් නීතියක් හෝ පනතක් සංශෝධනයට හේතු වන කාරණා කීපයක් වේ.

- පවත්නා නීතියේ එනම් මව් නීතියේ ඇති දෝෂ සහ අඩුපාඩු මෙන්ම ඒ දෝෂ සහ අඩුපාඩු මඟහරවාගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිකර්ම යෙදීම
- මුලු රටටම අදාල කර ගත හැකි ඒකාකාරී නීති ක්‍රමයක් සහතික කිරීම
- පරිපාලන හා තීරණ ගැනීමේ ක්‍රියාවලියට ජනතාව නියෝජනය වීම
- ජනතාවගේ අවශ්‍යතා සපුරාලන සාර්ථක පරිපාලන ක්‍රමයක් සහතික කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම

මේ අනුව පොදුවේ ගත් කල ජන සමාජයේ කාලීන අවශ්‍යතා පදනම් කරගෙන ඒ ආශ්‍රිත නීතිය බලාත්මක කිරීම හා විධිමත් කිරීම සඳහා කිසියම් පනතක් හෝ නීතියක් සංශෝධනයට ලක් කිරීමේ අපේක්ෂාව වේ.

ශ්‍රී ලංකාවේ පළාත් පාලන ව්‍යුහය තුල ඇති ප්‍රාදේශීය සභා සම්බන්ධයෙන් අදාල වූ නීතිය වන 1987 අංක 15 දරණ ප්‍රාදේශිය

සභා පනතද මේ වන විට තුන් වරක් සංශෝධන වී ඇත. 1993 අංක 34 දරණ පනතින් මව් නීතියේ 132 වගන්තිය[1] , සහ1999 අංක 14 දරණ පනතින් මව් නීතියේ 9A සහ 9B යන වගන්ති[2] සහ 2012 අංක 21 දරණ පණතින් මව් නීතියේ 4 වන වගන්තිය 133 වගන්තිය (ප්‍රතියෝජනය) සහ 169 වගන්තිය සංශෝධනය වී ඇත.

මේ අතුරින් 2012 අංක 21 දරන පලාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත යටතේ කරන ලද සංශෝධනයන් පළාත් පාලන ක්ෂේත්‍රයේ මූල්‍ය හා පරිපාලනයේ විශේෂ අවධානයට යොමු කළ යුතු කරුණු කීපයක් උද්දීපනය කර ඇත. ඒ අනුව විෂයභාර අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබීමෙන් පසු ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් අනතුරුව 2012 අංක 21 පළාත් පාලන විශේෂ විධිවිධාන පනත (සංශෝධන සහිත) මේ වනවිට ක්‍රියාත්මක වෙමින් පවතී.

යථෝක්ත සංශෝධන මඟින් ක්‍රියාත්මක කිරීමට නියම වී ඇති විධිවිධාන පිළිබඳව පලාත් පාලන ආයතන ප්‍රධානීන්, මහජන නියෝජිතයින් හා නිලධාරීන් අතර සාකච්ඡාවට භාජනය වී ඇති, එමෙන්ම තර්ක විතර්ක වලට සහ මතබේදයන්ට ප්‍රවේශයක් වී ඇති කරුණක් වේ. මේ සඳහා නිරීක්ෂණය වුයේ යථෝක්ත සංශෝධන පිළිබඳව ඔවුන්ට පැහැදිලි හා පුළුල් අවබෝධයක් ලබාදීම සමාජ මෙහෙවරක් වශයෙන් වඩාත් වැදගත් වන බවයි.

2012 අංක 21 දරන පළාත් පාලන ආයතන ( විශේෂ විධිවිධාන) පනත යටතේ වූ සංශෝධන අතුරින් විශේෂයෙන් ශ්‍රී ලංකාවේ පලාත් පාලන ආයතන ව්‍යුහයේ බහුතරයක් නියෝජනය වන ප්‍රාදේශීය සභා සම්බන්ධව මෙම හැඳින්වීමේදී වැඩි අවධානයක් යොමු කර ඇත.

---

1 සංශෝධනය -1 1993 අංක 34 දරණ පනතෙන් මව් පනතේ 132 වන වගන්තියෲ සභාපති තුමා/ උපසභාපති තුමා / තුමිය ගේ නිවාසවලට සපයන නිළ දුරකථන පහසුකම් ස්ථාපන කිරීම සහ නඩත්තුකිරීම සම්බන්ද වියදම් ලෙසින් සංශෝධන වී ඇත

2 සංශෝධනය - 2 1999 අංක 14 දරණ පනතින් මව් පනතේ 9 වන වගන්තියට ඉක්බිතිව 9 “අ” උප වගන්ති 4 සහිතව සහ 9 “ආ” උප වගන්ති 3 සහිතව ඇතුලත් කර ඇත. මෙම අලුත් වගන්ති වලින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සීමාවන් වෙනස් කිරීමට ද, සභිකයන් සංඛ්‍යාව වෙනස් කිරීමට ද, ප්‍රා.ස. විසුරුවා හැරීමට ද සහ ප්‍රතියෝජනය කිරීමට ද විෂය භාර අමාත්‍ය වරයාට ඇති බලය පැහැදිලි කෙරේ.

**ප්‍රධාන පනතේ 04 වන වගන්තිය සංශෝධනය කිරීම**

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 1 වන කොටසෙහි ප්‍රාදේශීය සභාවල සංස්ථාපනය පිළිබඳ විධිවිධාන ඇතුලත් කර ඇත. යථෝක්ත වගන්තිය යටතේ වූ (4) (1) වගන්තියෙහි දැක්වෙන විධිවිධානයන් ඉහත කී 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන ( විශේෂ විධිවිධාන) පනත යටතේ සංශෝධනය කරමින් 4 (1) (අ) හා 4(1) (ආ) සහ 4(2) (1) ලෙස සලකුණු කරමින් අතිරේක විධිවිධාන කීපයක් ඇතුලත් කර ඇත.

සංශෝධනවලට පෙර මව් පනතේ සංස්ථාපනය පිළිබඳව ඇති විධිවිධාන සහ 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ ප්‍රාදේශීය සභාවල සංයුතිය සම්බන්ධයෙන් ඇතුලත් කර ඇති විධිවිධාන සමාලෝචනය කර බැලීමේදී පළාත් පාලන ආයතන මඟින් ජනතාවගේ අවශ්‍යතා සපුරාලන සාර්ථක ක්‍රමයක් සහතික කිරීම අරභයා මෙන්ම පළාත් පාලන ආයතන බලප්‍රදේශ වල ජනතා නියෝජනය යථාර්තවාදී කිරීම සඳහා ඉහත සංශෝධන ඇතුලත් කර ඇති බව අවබෝධ කරගත යුතුය. ඒ තුලින් ප්‍රජාතාන්ත්‍රවාදීව පරිපාලනමය හා සංවර්ධන කටයුතු වලට අදාලව තීරණ ගැනීමේ ක්‍රියාවලියෙහි ප්‍රාදේශීය මට්ටමින් ජනතාවට ඵලදායී ලෙස සහභාගී වීම සඳහා වැඩි අවස්ථා සලසා දීමේ අරමුණ මූලික කරගෙන යථෝක්ත සංශෝධන අන්තර්ගත කර ඇති බව නිරීක්ෂණය වේ.

**ප්‍රධාන පනතේ 133 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම**

මේ යටතේ ප්‍රාදේශීය සභා අරමුදලින් කරනු ලබන සියළුම ගෙවීම් සඳහා වූ චෙක්පත් අණකර ආදිය සම්බන්ධයෙන් වූ විධිවිධාන ප්‍රතියෝජනයට ලක්කර ඇත. ඒ අනුව මව් නීතියේ 133 වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාව විසින් විශේෂයෙන් බලය පවරන ලද නිලධාරීන් දෙදෙනෙකුට චෙක්පත් අත්සන් කිරීමට බලය පැවරිය හැකි අතර ඒ සඳහා අනුමැතිය ලබාගත යුත්තේ පළාත් පාලන සහකාර කොමසාරිස් වෙතින්ය.

කෙසේ වුවද මව් පනතේ 133 වගන්තිය යටතේ සඳහන් විධිවිධාන ඉවත් කොට ඒ සඳහා පහත දැක්වෙන විධිවිධානයන් ආදේශ කිරීම ඉහත කී 2012 අංක 21 දරන පනතින් සිදු කර ඇත.

-ප්‍රාදේශීය සභාවේ ප්‍රාදේශීය සභා අරමුදලින් කරනු ලබන සියලු ගෙවීම් සඳහා වූ චෙක්පත් හෝ අණකර, කොමසාරිස්වරයාගේ අනුමැතියට යටත්ව, තත්කාර්ය සඳහා ප්‍රදේශීය සභාව විසින් විශේෂයෙන් බලය පවරන ලද, සභාවේ සභාපතිවරයා නොවන වෙනත් නිලධාරීන් දෙදෙනකු විසින් අත්සන් කරනු ලැබිය යුතු ය. එකී අරමුදල පිහිටුවා ඇත්තේ යම් බැංකුවක ද, ඒ බැංකුව විසින්, එසේ අත්සන් කරන ලද සියලු අණකර හා චෙක්පත් වෙනුවෙන් අරමුදලින් ගෙවීම් කරනු ලැබිය හැකි ය."

මෙම සංශෝධන සිදු කර ඇත්තේ කුමක් නිසාද යන්න විචාරාත්මකව සලකා බැලිය යුතුය. සංශෝධනයට පෙරාතුව සියළුම ප්‍රාදේශීය සභාවල චෙක්පත් අත්සන් කිරීමේ නිලධාරියෙකු ලෙස ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන විධායක බලධරයා වන සභාපතිවරයා කටයුතු කල බවත් චෙක්පත් අත්සන් කිරීමේ නිලධාරීන්ගේ අත්සන් අනුමත කිරීම පළාත් පාලන සහකාර කොමසාරිස්වරයා විසින් සිදුකරන ලද බවත් අපි දනිමු. එහෙත් යථෝක්ත ප්‍රතියෝජනය සිදු කර ඇත්තේ බහුතරයක් පලාත්පාලන ආයතන වල අවිධිමත් ගෙවීම් හා මූල්‍ය පාලනය පිළිබඳව අභ්‍යන්තර පාලනයේ සිදුවී ඇති ඌනතා පිලිබඳව විගණන විමසුම් වලින් පෙන්වාදී තිබීමත් ඇතැම් පළාත් පාලන ආයතන විගණන අධිභාර(Surcharge) වලට යටත්වී ඇති බවත් සැලකිල්ලට ගනිමින් බව පෙන්වා දිය යුතුය.

ඒ අනුව විශේෂයෙන් ප්‍රාදේශීය සභාවල ගෙවීම් ක්‍රියාවලියේදී විනිවිදභාවය හා වගවීම තහවුරු කිරීම සඳහාත් ඒ ආශ්‍රිත මූල්‍ය පාලනය හා මූල්‍ය විනය ආරක්ෂා කිරීම සඳහාත් යථෝක්ත ප්‍රතියෝජනය ඉතා වැදගත් බව සැලකිය යුතුය. එමෙන්ම චෙක්පත් අත්සන් කිරීමේ හිමිකම හා බලය සභාපතිවරයා නොවන වෙනත් නිලධාරියෙකුට පැවරීමට විධිවිධාන සලසා තිබීම තුලින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විගණන විමසුම් හා අධිභාරවලින් නිදහස්

වීමක් සිදු නොවේ. [3]ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති 4 සහ 5 පිලිබඳව විශේෂ අවධානය යොමු කරවමි. ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන විධායක බලධරයා ලෙස නිසි අධීක්ෂණයක් පවත්වාගෙන යාමටත් යහපාලනය ගොඩනඟා ගැනීමටත් මෙම ප්‍රතියෝජනය පිටුවහලක් වන බව අමතක නොකල යුතුය.

**ප්‍රධාන නීතියේ 169 වන වගන්තිය සංශෝධනය කිරීම**

ප්‍රාදේශීය සභා අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පැහැදිලි කරන IV වන කොටසටම අයත් 169 වන වගන්තියෙන් අයවැය ලේඛණය සම්බන්ධයෙන් සභාපති වරයා සතු බලතල පැහැදිලි කරන අතර මව් පනතේ මෙසේ දක්වා ඇත.

> -යම්කිසි අයවැය ලේඛනයක හෝ පරිපූරක අයවැය ලේඛනයක ඇතුළත් සියලු විෂයයන් නැතහොත් විෂයයන් කිසිවක් ප්‍රාදේශීය සභාව විසින් සංශෝධනය කරනු ලැබුවහොත්, හෝ ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ ඒ විෂයයන්ට යම් කිසිවක් එකතු කරනු ලැබුවහොත්, සහ ප්‍රාදේශීය සභාවේ එවැනි යම් තීරණයකට සභාපතිවරයා එකඟ නොවුවහොත්, තවදුරටත් සලකා බලනු ලැබීම සඳහා ඒ අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය සභාපතිවරයා විසින් ප්‍රාදේශීය සභාව වෙත නැවත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. යම් අයවැය ලේඛනයක් හෝ පරිපූරක අයවැය ලේඛනයක් එසේ නැවත ඉදිරිපත් කරනු ලැබීමෙන් පසු දෙසතියක් ඇතුළත දී ප්‍රාදේශීය සභාව විසින් එය සම්මත කරනු නොලැබූ අවස්ථාවක, ඒ අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය ප්‍රාදේශීය සභාව විසින් සම්මත කරනු නොලැබුව ද එය ඒ ප්‍රාදේශීය සභාව විසින් යථා පරිදි සම්මත කරන ලද අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය ලෙස සලකනු ලැබිය යුතු ය."

## ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති 4 සහ 5

**[3]ප්‍රාදේශීය සභා (මූල්‍ය පරිපාලන) රීති අංක 04 / 05 කෙරෙහි විශේෂ අවධානය යොමු කරමි**

4. සභාපතිවරයා ප්‍රාදේශීය සභාවේ ගිණුම් නිළධාරියා වන අතර මෙම නීති වලට හා පළාත් පාලන අමාත්‍යවරයා විසින් නිකුත් කෙරෙනු ලැබිය හැකි උපදෙස්වලට ද යටත්ව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය හා ගිණුම මෙහෙයුම් කටයුතු ඔහුගේ පොදු කළමනාකරණය හා අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක විය යුතුය.

[5] පහත සඳහන් කරුණු සහතික කරලීම සභාපතිගේ කාර්යයක් වේ

(1) ප්‍රාදේශීය සභාව හා එහි උප කාර්යාල තුල ප්‍රමානණවත් ආකාරයක මූල්‍ය පාලනයක් පිහිටුවන බව තහවුරු කිරීම

(2) වැඩ සටහන් අනුව වියදම් වර්ගීකරණය කිරීම මඟන් සභාවේ මූල්‍ය කටයුතු නිසි පරිදි සැලසුම් කර තිබෙන බව සහ සියලු මූල්‍ය ගනුදෙනු මුදල් රෙගුලාසි වලට අනුකූල වන පරිදි කෙරෙන බව සහතික කිරීම

(3) වියදම් හා ආදයම එක්රැස් කිරීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් ආකාරයක අභ්‍යන්තර පිරික්සීමක් පවත්වා ගෙන යාම

(4) යාවත්කාලින තොරතුරු සැපයෙන බව සහතික කිරීමේ කළමනාකරන ක්‍රමයක් පවත්වා ගෙන යාම

(5) සංවර්ධන සැලැස්මේ හා අයවැය ලේඛණයේ අන්තර්ගත වැඩ සටහන් සාර්ථක අයුරින් ක්‍රියාත්මක කෙරෙන බවට හා එමගින් උපචිත ප්‍රතිලාභයක් වියදම් හා සමග සමානුපාත වන බව සහතික කිරීම

(6) අදාළ නිළධාරින් නියම කාලසීමාව තුළදී ප්‍රාදේශීය සභාව වෙන අයවිය යුතු ආදායම් හ වෙනත් ගාස්තු එකතු කරන බවට හා ඒවා ගිණුගත කොට දක්වනු ලබන බව සහතික කිරීම

(7) මූල්‍ය හා ගබඩා ගනුදෙණු සම්බන්ධයෙන් ප්‍රමාණවත් ආකාරයක අභ්‍යන්තර විගණන ක්‍රමයක් පවත්වා ගෙන යනු ලබන බව සහතික කිරීම

(8) ප්‍රාදේශීය සභාවේ මුදල් සහ ස්ථාවර වත්කම් වල ආරක්ෂාව සහතික කිරීම පිළිබඳව අවශ්‍ය කටයුතු යොදා හැකිබව සහතික කිරීම

(9) වැඩසටහන් අනුව වර්ගීකරණය කරන ලද ආදායම් හා වියදම් ප්‍රකාශයක් සෑම මසකම සභාව වෙත වෙන ඉදිරිපත් කෙරෙන බව සහතික කිරීම

(10) මාසිකව බැංකු සැසඳුම ප්‍රකාශයක් පිළියෙල කෙරෙන බව සහතික කිරීම

(11) මාර්ගස්ථ මුදල් සහ වෙනත් වටිනා භාණ්ඩයන් සම්බන්ධයෙන් නිසි ආකාරයක රක්ෂණ ක්‍රියා මාර්ගයක් ගෙන ඇති බව සහතික කිරීම

(12) මුදල් හා ගබඩා කටයුතු පිළිබඳව වගකියන නිළධාරින් වෙතින් ප්‍රමාණවත් ඇපකර ලබා ගෙන ඇති බව සහතික කිරීම

(13) සභාවේ මහා සභා රැස්වීම් පැවැත්වෙන අවස්ථාවේ දී වාර්ෂික අයවැය හා සංවර්ධන සැලැස්ම ඉදිරිපත් කරනු ලැබෙන බව සහතික කිරීම

2012 අංක 21 පනතේ හඳුන්වා දෙන සංශෝධනයේ දී 169 වගන්තිය පහත පරිදි සංශෝධනය කර ඇත.

-එසේ වුව ද, සභාවේ නිල කාලය ආරම්භ වී වසර දෙකකින් ඉක්බිතිව සභාපතිවරයා විසින්, කවර හෝ අවස්ථාවක සභාවට ඉදිරිපත් කරනු ලබන අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය සම්බන්ධයෙන් මෙම පනතේ 168 වන සහ 169 වන වගන්ති අනුව කටයුතු කිරීමෙන් අනතුරුව එම අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනයේ සියලුම විෂයයන් හෝ ඉන් යම් විෂයයක් හෝ සභාව විසින් සුළු වශයෙන් වෙනස් කරනු ලැබුවහොත් හෝ ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ ඊට යම් විෂයයක් එකතු කරනු ලැබුවහොත්, සභාවේ එවැනි යම් තීරණයකට සභාපතිවරයා එකඟ නොවන්නේ නම්, ඔහු විසින් එම අයවැය ලේඛනය තවදුරටත් සලකා බැලීම සඳහා සභාව වෙත නැවතත් ඉදිරිපත් කළ යුතු ය. එය එසේ දෙවන වරටත් නැවත ඉදිරිපත් කරනු ලැබීමෙන් සති දෙකක් ඇතුළත සම්මත කරනු නොලැබූ අවස්ථාවක, එකී සති දෙකක කාලය අවසන් වීමෙන් පසුව සභාපතිවරයා ස්වකීය සභාපති ධුරයෙන් ඉල්ලා අස්වූවා සේ සලකනු ලැබිය යුතු ය.

මේ අනුව 169 වන වගන්තියට 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතින් එක් කරන ලද සංශෝධනය කිසියම් ආකාරයක සුවිශේෂී තත්වයක් පෙන්නුම් කරයි. එනම්, ඡන්දයෙන් තේරී පත් වූ සභාපතිවරයාට ධුරයේ කටයුතු කිරීමට හිමි වසර 4 ක කාලය අභියෝගයකට ලක්ව තිබීමයි.

යථෝක්ත සංශෝධන මඟින් සිදු කර ඇති විධිවිධාන,සිය සභාවේ ප්‍රධාන විධායක බලධරයා හෝ බලධාරිනිය වශයෙන් ප්‍රාදේශීය සභා පනතේ 168 වගන්තියේ ඇති විධිවිධාන අනුව වාර්ෂික අයවැය ලේඛනය සභාවට ඉදිරිපත් කිරීමේදී විනිවිදභාවය, සමානාත්මතාවය හා සහභාගිත්ව සැලසුම් ක්‍රමවේදය අනුගමනය කිරීම තුලින් මෙම අභියෝගයට සාර්ථකව මුහුණ දීමට හැකියාව ලැබෙනු ඇත. විශේෂයෙන් වාර්ෂික අයවැයෙන් ප්‍රතිපාදන වෙන් කිරීමේදී පක්ෂ භේදයකින් තොරව සමස්ත බලප්‍රදේශයම ආවරණය වන පරිදි සැලසුම් හා සංවර්ධන කටයුතු කිරීමටත් කණ්ඩායම් හැඟීමකින් යුතුව කටයුතු කිරීම තුලිනුත් වාර්ෂික අයවැය සම්බන්ධව මහා සභාවේ අනුමැතිය ලබාගැනීම අපහසු කාර්යයක් නොවේ.

මේ අනුව අයවැය ලේඛනය සම්බන්ධයෙන් සභාපතිවරයා සතු බලතල සීමාවන පරිදි සිදු කර ඇති සංශෝධන අනුව පැහැදිලි වන්නේ වාර්ෂික අයවැය ලේඛනය නිසි මූල්‍ය කළමනාකරනයකින් යුතුව පිළියෙල කරනු ලබන වාර්ෂික මූල්‍ය සැලැස්මක් බවටත් එය මහජන මතය පිළිබිඹු වන හා මහජන අපේක්ෂාවන් උපරිම ලෙස ඉටුවන අන්දමින් සකසනු ලබන මෙවලමක් බවටත් පත් කළ යුතු බවය. එමෙන්ම වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කිරීම සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන සංස්ථාපිත අනපනත් වලින් සහ රීති හා රෙගුලාසි මඟින් නියම කර ඇති පරිදි පළාත් පාලන ආයතන ප්‍රධානීන් ක්‍රියාකරන්නේ නම් ඉහත සංශෝධන තම ධූරයට හෝ බලතල වලට අභියෝගයක් නොවන අතර එය සිය සභාවේ දැක්ම කරා ලඟා වීමටත්,තම ජයග්‍රහණය කරා යොමු වීමේ පැහැදිලි මාවතක් බවත් අවබෝධ කර ගත යුතුය.

248396

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

## 1993 අංක 34 දරන ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1993 අගෝස්තු මස 13 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1993 අගෝස්තු මස 13 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල: ශත 30 යි. තැපැල් ගාස්තුව : රු. 1,00 යි.

## 1993 අංක 34 දරන ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1993 අගෝස්තු මස 13 වන දින]

එල්. ඩී.—ඕ. 22/92

**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1993 අංක 34 දරන ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වන වගන්තියේ (ග) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අළුත් ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1987 අංක 15 දරන පනතේ 132 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ගග) සභාපතිවරයාගේ සහ උප සභාපතිවරයාගේ වාසස්ථාන වල රාජකාරි දුරකථන පහසුකම් සැපයීම සහ නඩත්තු කිරීම පිණිස ප්‍රාදේශීය සභාව විසින් දරනු ලබන සියලු වියදම් ; ".

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

| සංශෝධනය | | | |
|---|---|---|---|
| 08 | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

ඇමුණුම 2 : Act No. 14 of 1999

ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 1999 අංක 14 දරන ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1999 ජුනි මස 15 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1999 ජුනි මස 18 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ** ගැසට් **පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ** : රු. **4.50** සි. තැපැල් ගාස්තුව : රු. **3.50** සි.

**1999 අංක 14 දරන ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1999 ජුනි මස 15 වන දින.]

එල්. ඩී.—ඕ. 24/95.

**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1999 අංක 14 දරන ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති පිළිවෙලින් ඒ පනතේ 9අ සහ 9ආ වගන්ති ලෙස බලපැවැත්විය යුතු ය :— 1987 අංක 15 දරන පනතේ 9අ සහ 9ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

"ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ සීමාවන් වෙනස් කිරීමට ද සභිකයන් සංඛ්‍යාව වෙනස් කිරීමට ද ප්‍රාදේශීය සභාව විසුරුවා හැරීමට සහ ප්‍රතියෝජනය කිරීමට ද අමාත්‍යවරයාට ඇති බලය.

9අ. ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් ඕනෑම අවස්ථාවක දී—

(අ) 2 වන වගන්තියේ විධිවිධානවලට අනුකූල වන ආකාරයකින් යම් ප්‍රාදේශීය සභා ප්‍රදේශයක සීමාවන් වෙනස් කිරීම ;

(ආ) 4 වන වගන්තියේ දක්වා ඇති ප්‍රතිපත්තිවලට අනුකූලව, යම් ප්‍රාදේශීය සභාවක් සඳහා 4 වන වගන්තිය යටතේ තීරණය කරනු ලබන සභිකයන්ගේ සංඛ්‍යාව වෙනස් කිරීම ;

(ඇ) දැනට පවත්නා යම් ප්‍රාදේශීය සභාවක් විසුරුවා හැර, පවත්නා ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කරන ලද්දේ යම් ප්‍රාදේශීය සභා සීමා සඳහා ද ඒ ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ සීමාවල යම් වෙනස් කිරීමක් මත, ඒ පවත්නා ප්‍රාදේශීය සභාව වෙනුවට, නව ප්‍රාදේශීය සභාවක් සංස්ථාපනය කිරීම යෝග්‍ය යයි අමාත්‍යවරයාට පෙනී යන කවර විටක වුවද, නව ප්‍රාදේශීය සභාවක් මගින් ඒ ප්‍රාදේශීය සභාව පුනස්ථාපනය කළ යුතු යයි විධාන කරනු ලැබිය හැකි ය ;

2—D 038704—5,900 (95/12)

(ඇ) යම් ප්‍රාදේශීය සභාවක් වෙනුවට මහ නගර සභාවක් හෝ නගර සභාවක් ස්ථාපනය කිරීමේ කාර්ය සඳහා ඒ ප්‍රාදේශීය සභාව විසුරුවා හැරීම. මහ නගර සභාවක් ස්ථාපනය කිරීමේ දී අමාත්‍යවරයා විසින්, මහ නගර සභා ආඥාපනතේ 2 වන වගන්තියේ විධිවිධාන ඉටු කරනු ලැබිය යුතු අතර, ඒ මහ නගර සභාව ස්ථාපනය කරනු ලබන්නේ කවර ප්‍රදේශයක් සඳහා ද ඒ ප්‍රදේශයේ සංවර්ධනය හෝ පහසුකම් සැලකිල්ලට ගැනීම ද කළ යුතුය; එසේම නගර සභාවක් ස්ථාපනය කිරීමේ දී අමාත්‍යවරයා විසින් නගර සභා ආඥාපනතේ 2 වන වගන්තියේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු ය :

එසේ වුවද, මේ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කරන ලද කිසිදු නියමයක්, ඒ නියමයේ සඳහන් දැනට පවත්නා යම් ප්‍රාදේශීය සභාවක සභිකයන්ගේ ධුර කාලය ඉකුත්ව යන තෙක් බලාත්මක නොවිය යුතු ය.

නව ප්‍රාදේශීය සභාව දැනට පවත්නා ප්‍රාදේශීය සභාවේ අනුප්‍රාප්තිකයා විය යුතු බව.

9ආ. විසුරුවා හරිනු ලැබූ යම් සභාවක් වෙනුවට 9අ වගන්තිය යටතේ යම් නව ප්‍රාදේශීය සභාවක් සංයුක්ත කරනු ලැබූ අවස්ථාවක දී—

(අ) නව සභාව සංයුක්ත කරනු ලැබූ ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමාවලට, විසුරුවා හරින ලද සභාව සංයුක්ත කරනු ලැබූ ප්‍රාදේශීය සභා ප්‍රදේශය හෝ ඉන් කොටසක් ඇතුළත් වන තාක් දුරට, ඒ ප්‍රදේශයට හෝ එහි කොටසට අදාළ සියලු කාර්ය සඳහා නව සභාව, එය සංයුක්ත කළ දිනයේ සිට, විසුරුවා හරින ලද සභාවේ අනුප්‍රාප්තිකයා විය යුතු ය ;

(ආ) නව සභාවේ පරිපාලන සීමා තුළ පිහිටි, විසුරුවා හරිනු ලැබූ සභාවේ සියලු දේපළ ද, ඒ විසුරුවා හරින ලද සභාවේ සියලු

අයිතිවාසිකම්, බලතල, කාර්ය, ණය, බැරකම් හා වගකීම්, නව සභාවේ පරිපාලන සීමා ඇතුළත යම් ප්‍රදේශයකට අදාළ වන තාක් දුරට නව සභාව සංයුක්ත කරනු ලැබූ දින සිට ඒ නව සභාව වෙත පවරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය ;

(ඇ) යම් ප්‍රඥප්තියක හෝ එය යටතේ සාදන ලද යම් නියමයක, රීතියක, නියෝගයක හෝ අතුරු ව්‍යවස්ථාවක හෝ ඒ ප්‍රඥප්තිය ප්‍රකාරව ලියා අත්සන් කරන ලද හෝ නිකුත් කරන ලද ලේඛනයක හෝ සාධන පත්‍රයක එවැනි විසුරුවා හරින ලද සභාවක් සම්බන්ධයෙන් කරන ලද සියලු සඳහන් කිරීම්, නව ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමාවලට ඇතුළත් කරනු ලැබිය යුතු විසුරුවා හරිනු ලැබූ ඒ සභාවේ පරිපාලන සීමාවලට අයත් යම් ප්‍රදේශයක කාර්යය සඳහා, නව සභාවට කරන ලද සඳහන් කිරීම් වූවාක් මෙන් තේරුම් ගත යුතු ය.".

අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත පිළිබඳ හැඳින්වීමක්

**මංජුල ගජනායක**

ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රියාවලිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රබල පෙළගැස්මක් මෑතකාලීනව දක්නට ලැබුණි. 1978 හඳුන්වාදෙන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත් සමඟ එළිදුටු සමානුපාතික නියෝජන ක්‍රමය මෙකී ජනතා පෙළගැස්ම වඩාත් සක්‍රීය කරන සුළු සාධකයක් බවට පත් වූ බවක් නිරීක්ෂණය කළ හැකිය. ප්‍රජාතන්ත්‍රවාදී වූ මැතිවරණ පැවැත්වීම හැම විටම යුක්තිගරුක හා නීතිගරුක වූ ආණ්ඩුවක පදනම සේ සැලකීමේ වරදක් නැත. ඒ අනුව පොදුවේ මැතිවරණ ක්‍රමයේ පවත්නා හොඳ නරක පිළිබඳ යම් සංවාදයක් ඇතිවීම හා ඒ අනුසාරයෙන් වඩාත් හිතකර සංශෝධන මැතිවරණ පනත් හෝ ආඥා පනත් තුළට එකතුවීම නිදහස් හා සාමකාමී ජන සමාජයක නිරන්තර අපේක්ෂාවයි.

ඒ අනුව 2010 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත මඟින් මහනගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා යන ත්‍රිවිධාකාර වූ පළාත් පාලන ආයතනවල පැවැත්විය යුතු මැතිවරණ වලට අදාළ නීතිවල දැඩි වෙනස්කම් ගණනාවක් මුලින්ම යෝජනා කරන ලදී.

එකී යෝජනා කරළියට පැමිණීමට පෙරද සමස්ත මැතිවරණ ක්‍රමයම සංශෝධනය කළ යුතුය යන්න ඉතා සුවිශේෂී තත්වයන් සලකා බලා පත්කරන ලද කමිටු වාර්තා දෙකකම සඳහන් විය. එනම් තරුණයන් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව[4] සහ පළාත් පාලන ප්‍රතිසංස්කරණ පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව[5] යන වාර්තා ද්විත්වයයි.

---

4 තරුණයන් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව සැසි පත්‍ර අංක 1990 මාර්තු

5 පළාත් පාලන ප්‍රතිසංස්කරණ පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව අංක 1 දරණ සැසි වාර්තාව - 1999

මෙහිදී 1990 දී පත්කරන ලද කොමිෂන් සභාව, පොදුවේ තරුණයන් මුහුණදෙන ගැටලු පිළිබඳ ගැඹුරු නිරීක්ෂණයක් සිදු කරන අතරතුර තරුණයන්ගේ දේශපාලන අයිතිය සහතික කිරීමට අදාළ නිර්දේශ ගණනාවක් හඳුන්වා දුන්නේය. ඉන් ප්‍රමුඛතම එකක් වූයේ වැඩි තරුණ සහභාගීත්වයකට ඉඩකඩ සැලසෙන පරිදි තරුණයන්ට හිමි පංගුව එනම් නාමයෝජනා භාර දීමේදි තරුණ ප්‍රජාවට වැඩි ඉඩකඩක් ලබා දිය යුතුය යන්නයි. ඊට අමතරව පළාත් පාලන ප්‍රතිසංස්කරණය පිළිබඳ කොමිෂන් සභාව විසින් ද මැතිවරණ ක්‍රමය වෙනස්විය යුතුය යන්න තහවුරු කිරීම සඳහා නිරීක්ෂණ, නිගමන හා නිර්දේශ ගණනාවක් ඉදිරිපත් කරන ලදි. මැතිවරණ නීතිය සංශෝධනය කිරීම යන අනු මාතෘකාව යටතේ තම අදහස් පිළිබඳ කරුණු දක්වන කොමිසම මෙසේ පවසයි.

**මැතිවරණ නීතිය සංශෝධනය කිරීමඃ** - “ඉහත නිර්දේශ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ ආඥා පනත් මුළුමනින්ම පාහේ ප්‍රතිශෝධනය කිරීමට සිදු වන බව පෙනී යන බැවින්, වඩාත් යෝග්‍ය ක්‍රමය වන්නේ එම පනත අවලංගු කර සුළු නගර සභා හා ගම් සභා පැවති අවධියේ තිබූ -පළාත් පාලන ඡන්ද විමසීම් පනත් අවශ්‍ය සංශෝධන සහිත ව නැවත ක්‍රියාත්මක කිරීමයි. එම සංශෝධනයන් කිරීම මෙම පරිච්ඡේදය තුළින් යෝජනා කර ඇති ප්‍රතිසංස්කරණයන් ක්‍රියාවට නැංවීමේ අරමුණින් එය කළ යුතු බවද යෝජනා කරමු”.

මෙකී නිරීක්ෂණ වඩාත් සුවිශේෂී හා වැදගත් වන්නේ එය පළාත් පාලන ක්ෂේත්‍රයම ඉලක්ක කර ගත් එකක් වීම නිසාය.

**මැතිවරණ ප්‍රතිසංස්කරණය පිළිබඳ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවඃ** එවක බලපැවැත්වූ මැතිවරණ නීති පිළිබඳ සලකා බලා පාර්ලිමේන්තුව වෙත 2004 ජනවාරි මස 23 වැනි දින පිරිනැමූ අතුරු වාර්තාව අනුව පාර්ලිමේන්තුව විසින් ඉහත තේරීම් කාරක සභාව පත් කරන ලදි. ඒ 2006 අප්‍රේල් මස 04 වැනි දිනයි. සාමාජිකයන් 32 කුගෙන් සමන්විත වූ මෙම කමිටුව තම නිර්දේශ 2007 ජුනි මස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේය. එම වාර්තාවේ නිර්දේශ අතර ප්‍රමුඛතම නිර්දේශ ගණනාවක් දක්නට ලැබුණු අතර පහත නිරීක්ෂණ වඩාත් සුවිශේෂී විය.

- පාර්ලිමේන්තු හා පළාත් සභා යන මැතිවරණ වලටද යෝජනා කළ පරිදි 30% සමානුපාතික නියෝජන ක්‍රමයක් සහිතව කේවල ඡන්ද ක්‍රමය (First - Past the post system) නැවත පළාත් පාලන ආයතන මැතිවරණවලට හඳුන්වා දීම.
- සුළුතර ජාතීන්ගේ හා ප්‍රජාවන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී වූ නියෝජනය සහතික කරනු වස් අදාළ ප්‍රදේශවල සංවර්ධනය විවිධාංගීකරණයට ලක් කිරීම හා කළමනාකරණයත්, ආර්ථික අවශ්‍යතා සපුරාලීමත් පදනම් කර ගනිමින් වර්තමානයේ පළාත් පාලන ආයතනවල පවත්නා සීමාවන් නැවත නිර්ණය කිරීම.

මෙම යෝජනා ද ඇතුළත්ව පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ නිර්දේශ සැලකිල්ලට ගනිමින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද ප්‍රථම සංශෝධනය 2012 ඔක්තෝබර් මසදී ගෙනෙන ලදි.

2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතට අදාළ මෙම සංක්ෂිප්ත සටහනේ මූලික අරමුණ වන්නේද මෙසේ ඉදිරිපත් කරන ලද සංශෝධනය පිළිබඳ කෙටියෙන් කරුණු දැක්වීමයි.

මුලින් දැක් වූ කාරණාවල ප්‍රතිඵල ලෙස විශේෂයෙන් දිනේෂ් ගුණවර්ධන කමිටු වාර්තාව මඟින්ද අවධාරණය කළ පරිදි හඳුන්වා දුන් මෙකී සංශෝධනයට පෙර නොවූ විරූ ආකාරයේ අවධානයක් යොමු විය. මීට සමගාමීව පළාත් පාලන ආයතන විශේෂ විධිවිධාන (සංශෝධන) පනත ද පාර්ලිමේන්තුවේ සම්මත කරන ලද අතර[6] ඒ පිළිබඳ හැඳින්වීමක් මෙහි මුල් භාගයේ ශ්‍රියාණි විජේසුන්දර විසින් සිදු කර ඇත.

මෙකී යෝජනා කෙටුම්පත් කොට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ අවස්ථාවේදී[7] ඒ පිළිබඳව ඇති වූ පුළුල් මහජන අවධානයට දායකවනු වස් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ද සංක්ෂිප්ත විවරණයක්

---

6 අංක 21 දරණ 2012 පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත

7 වර්ෂ 2010 ඔක්තෝබර්

8 2010 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ වගුගත කෙටි විවරණයකි ඃ භවානි ෆොන්සේකා, සුපිපි ජයවර්ධන සහ මිරාක් රහීම් - 2010 ඔක්තෝබර් 2010

එහිලා එළි දක්වන ලදි.[7] එසේ යෝජිත සංශෝධනවල හරය පිළිබඳව වි ප්‍ර. කේ. මඟින් ප්‍රකාශිත කෙටි විවරණය, මෙසේ කරුණු දක්වයි.

"සරල බහුතර සහ සමානුපාතික නියෝජන ක්‍රම මිශ්‍රකර සකස් කළ නියෝජන ක්‍රමයක් හඳුන්වාදීම කෙටුම්පතින් යෝජිත ප්‍රධාන සංශෝධනය වේ. පළාත් පාලන ආයතනයක් මැතිවරණ ඒකක ගණනාවකට බෙදනු ලබන කොට්ඨාශ ක්‍රමය කෙටුම්පතින් නැවත හඳුන්වා දේ. බහු සභික කොට්ඨාශයක් නොවන අවස්ථාවන් හි, එක් එක් කොට්ඨාශයට එක් සභිකයකු බැගින් තෝරා පත්කෙරේ. සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ තෝරා පත් කරන සංඛ්‍යාව නිශ්චිත නැත. පළාත් පාලන ආයතනයක සරල බහුතර නියෝජන ක්‍රමය යටතේ තෝරා පත්කළ සංඛ්‍යාවෙන් 30% ක උපරිමයක් සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ පත් කෙරෙනු ඇත.

මැතිවරණයක සුපිළිපන්න බව සහතික කිරීම උදෙසා ඡන්දය සලකුණු කිරීමේ සහ ගණන් කිරීමේ ක්‍රියාවලීන් ශක්තිමත් කිරීම ඇතුළු ඉතා වැදගත් ලක්ෂණ ගණනාවක් කෙටුම්පතෙහි අන්තර්ගතය. සාධනීය ක්‍රියාමාර්ග සැලකිල්ලට ගෙන ඇතත්, පහත දැක්වෙන ප්‍රතිපාදන ඇතුළුව කෙටුම්පතින් හඳුන්වා දී ඇති ප්‍රතිපාදන ගණනාවක් කෙරෙහි දැඩි අවධානයක් පවතී.

- ★ ආසන හා අපේක්ෂකයන් පුරප්පාඩු වීම සම්බන්ධයෙන් විශේෂ ක්‍රියාමාර්ග ගෙනහැර දක්වන අතරෙහි, ඡන්ද දායකයින් අතුරු මැතිවරණයකින් සිය තේරීම කරනු වෙනුවට දේශපාලන පක්ෂවල ලේකම්වරුන්ට සහ ස්වාධීන කණ්ඩායම් වල නායකයින්ට පුරප්පාඩු පිරවීමට පත්කිරීම් කිරීම සඳහා සුවිශේෂ බලයක් සපයයි.
- ★ පළාත් පාලන ආයතනයන්හි කොට්ඨාශ වෙන් කිරීමේ අරමුණ සඳහා වන සීමා නිර්ණය ක්‍රියාවලියේ දී ඇමතිවරයාට සුවිශාල බලයක් ලබා දෙන්නා වූ සීමා නිර්ණය ක්‍රියාවලියක් කෙටුම්පත මඟින් නිරූපනය කරයි.
- ★ නගරාධිපති වරයා ඉල්ලා අස්වීම නිසා පිරවූ පුරප්පාඩුව පසු අවස්ථාවක නැවත වරක් පුරප්පාඩු වුවහොත් අදාල පළාත්

පාලන ආයතනය විසුරුවා හැර ඇමතිවරයා විසින් කොමසාරිස්වරයකු පත්කරනු ඇත.

ද්විත්ව පක්ෂ ක්‍රමය නැවත ස්ථාපනය කිරීම මගින් සුළු ජන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් වලට ආසන සුරක්ෂිත කරගැනීමේ අවදානම ඉහල දැමීම ඇතුළු නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය බරපතල ලෙස ආපසු හැරවීම් කෙටුම්පතෙහි අන්තර්ගතය. සීමා නිර්ණය ක්‍රියාවලිය සහ මැතිවරණ ක්‍රියාවලිය යන දෙක තුලින්ම සුළු ජන වර්ග නියෝජනය වන බවට සුවිශේෂී සහතිකයක් නොමැත. ඊට අමතරව නාම යෝජනා ක්‍රියාවලියේදී කාන්තාවන් සහ තරුණයින් ඇතුලත් කිරීම සඳහා සහතිකවීමක් නොමැත. ආණ්ඩුවේ ජනතාවට සමීපතම ඒකකය පළාත් පාලන ආයතනයන් වන බැවින් තෝරා පත් කළ නිළධාරීන් ඔවුන්ගේ ඡන්ද කොට්ඨාශ නියෝජනය කරන බවට සහ ඒවාට වගවන බවට සහතික වීමේ අවශ්‍යතාවක් ඇත. කෙටුම්පත පළාත් පාලන ආයතන සඳහා නව ක්‍රියාමාර්ග හඳුන්වා දුන්නද එය පළාත් පාලන ආයතනයන් බලගැන්වීමට වඩා මධ්‍යම ආණ්ඩුවේ බලය පුළුල් කරන අතර අවසන් විග්‍රහයේදී නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය දුර්වල කරනු ලබයි"[9] .

ඊට අමතරව තවත් සංවිධාන, ආයතන, ක්‍රියාකාරීන්, හා වෙනත් ක්ෂේත්‍රයට අදාළ පුද්ගලයන් ගණනාවක් ද මේ පිළිබඳ කරුණු ඉදිරිපත් කර තිබුණි. මෙසේ හඳුන්වා දුන් සංශෝධන පිළිබඳ විවේචනාත්මක විග්‍රහයක් කිරීම මෙම සටහනේ අරමුණ නොවේ. නමුත් පොදුවේ දැක්විය හැක්කේ එලෙස විවිධ පාර්ශව හා පුද්ගලයන් හරහා පළ වු අදහස්, විරෝධතා හා යෝජනා පිළිබඳ එතරම් සැලකිල්ලක් මෙහිදී දක්වා නොමැති බවයි.නමුත් වර්තමානයේ පාර්ලිමේන්තු පනත් සම්මත කර ගැනීමේදී දක්නට ලැබෙන ඒකාධිකාරී ස්වරූපයට ප්‍රතිපක්ෂව මෙහිදි යම් සාධනීය ප්‍රතිචාර දැක්වීමක් 3/2 ක බහුතරයක් හිමි ආණ්ඩු පක්ෂය දක්වා ඇති බවද සැලකිල්ලට ගත යුතුය. එහිලා දැක්විය හැකි හොඳම නිදර්ශනය නම් 2012 ඔක්තෝබර් මස 10 වැනි දින මේ පිළිබඳ පැවති පාර්ලිමේන්තු

විවාදයේදී විපක්ෂය විසින් අවසන් මොහොතේදී යෝජනා කරන ලද යෝජනා 5කින් 3 ක්ම සංශෝධනාකාරයෙන් තුන්වන වර කියවීමේ දී ඇතුළත් කිරීමයි.[10]

**අරමුණු**

මෙකී සංශෝධනයේ ප්‍රධාන අරමුණක් වූයේ වර්තමානයේ පවත්නා මැතිවරණ ක්‍රමය මඟින් ජනිත කර ඇති ගැටලුවලට ආමන්ත්‍රණය කිරීමයි. මැතිවරණ ආශ්‍රිත ප්‍රචණ්ඩ ක්‍රියා, තම පාක්ෂියන්ට තම පළාතේ දේශපාලනඥයන් කිසිදු වගවීමක් නොමැති වීම, හා බහුතර ඡන්දයක් දිනා ගත නොහැකි වීම නිසා දේශපාලනිකව යම් යම් දේශපාලන පක්ෂ අර්බුදයට ලක්වීම ආදිය මෙහිලා ප්‍රමුඛ විය. කෙසේනමුත් මෙසේ යෝජිත සංශෝධන යම් තරමකට සමානුපාතික නියෝජන ක්‍රමයේ දුර්වලතා මඟහරවා ඇති බව නොවළහා කිව යුතුය. ඒ අතරතුර පහත සඳහන් දුර්වලතා / අභියෝගද දක්නට ඇත.

- **කේවල හා සමානුපාතික නියෝජන ක්‍රමයේ (FPP : PR System) සම්මිශ්‍රණයඃ** එවැනි ක්‍රමයක් යෝජනා කළ ද ඒ පිළිබඳ නිශ්චිත නීතිමය ප්‍රතිපාදන නොමැති වීම. 70% කේවල ක්‍රමය තුළින් හා 30% ක් සමානුපාතික නියෝජනය හරහා සභිකයන් තේරීම පිළිබඳව පැහැදිලිව සඳහන් වුවත් ඊට අදාළ නීතිය එහිලා පැහැදිලි නැත.

- **සුළුතර පක්ෂ කෙරෙහි අහිතකර ලෙස බලපෑමඃ**

  සුළුතර ජාතීන් නියෝජනය කරන පක්ෂ වලට[11] නිශ්චිත නියෝජනයක් පවතින පළාතක මෙය ගැටලුවක් නොවුනද සුළුජාතික නියෝජනය යම් තරමක් පමණක් පවතින වෙනත් පළාතක,එම සුලු පක්ෂවලට නියෝජනයක් ලබා ගැනීම දැඩිසේ ගැටලුකාරී විය හැකිය. බහු වාර්ගික හා බහු සංස්කෘතිමය සමාජයක් ලෙස සුළු ජාතික පක්ෂවල නියෝජනය ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් තුළ ඉතා වැදගත්

---

9 පිටු අංක 1, 2010 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ වගුගත කෙටි විවරණය, භවානි ෆොන්සේකා, සුපිපි ජයවර්ධන සහ මිරාක් රහීම්, 2010 ඔක්තෝබර්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, කොළඹ

10 (පාර්ලිමේන්තු විවාද හැන්සාඩ් - 2012 ඔක්තෝබර් 10 වන බදාදා)

11 දෙමළ ජාතික සංධානය, ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය, ලංකා කම්කරු කොංග්‍රසය ආදි පක්ෂ

බැවින් මෙවැනි අවම නියෝජනයක් පැවතිය හැකි වීම එතරම් හිතකර තත්වයක් නොවේ.

- **නාම යෝජනා පත්‍රඃ** ස්වාධීන කණ්ඩායම් වලට අදාළ ඇප මුදල් නාම යෝජනා පත්‍රය භාරදෙන අවස්ථාවේදී ස්වාධීන කණ්ඩායම් වලට අදාළව තැන්පත් කළ යුතු මුදල රු 250 සිට රු 20,000 දක්වා පරාසයක විහිදේ. දේශපාලන පක්ෂවලට සාපේක්ෂව මෙසේ ස්වාධීන කණ්ඩායම් වලින්ද වැඩි මුදලක් ඉල්ලා සිටීම වටහාගත නොහැකි තත්වයකි. ඒ පිළිබඳ අදාළ පාර්ලිමේන්තු විවාදයේදී දේශපාලන පක්ෂ දැක් වූ විරෝධය එදින හැන්සාර්ඩ් වාර්තාව කියවීමෙන් දැකගත හැකිය[12].

- **තරුණ හා කාන්තා නියෝජනයඃ** ශ්‍රී ලංකාව දකුණු ආසියා, කලාපයේ මැතිවරණ සඳහා ඉතා අඩු කාන්තා හා තරුණ නියෝජනයක් පවතින රටක් බවට පත් වී ඇත. එය පාකිස්තානයේ 33% ක් වන අතර (පළාත් පාලන ආයතන වලට අදාළව) ශ්‍රී ලංකාවේ 2% කි. එවන් පරිසරයක් තුළ මේ පිළිබඳ කටයුතු කරන ක්‍රියාකාරීන් එහිලා තරුණ ප්‍රජාව උදෙසා 40% පංගුවක් (Youth Quota) අපේක්ෂා කළ ද මෙකී සංශෝධනය හරහා ලබා දී ඇත්තේ 25% ක නියෝජනයකි. මෙම සංඛ්‍යාව පිළිබඳ අර්ථ දැක්වීමේදී සමහර ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන්[13] ඊට විවිධ අර්ථකථන ලබා දුන් බවක්ද දිස් විය. මෙම සංශෝධනයට අනුව තරුණ නියෝජනය 25% පමණක් වුව ද අවශ්‍ය නම් අදාළ දේශපාලන පක්ෂ නායකයන්ට හා ස්වාධීන කණ්ඩායම් නායකයන්ට එය 100% දක්වා වැඩි කළ හැකි බවක් ද එහිදි ප්‍රකාශවිය. බැලු බැල්මට එය සත්‍යයක් වුවද ප්‍රායෝගිකව දේශපාලන ක්ෂේත්‍රයේ එවැන්නක් දිස් නොවන බව සැවොම දන්නා කරුණකි.

---

12 පාර්ලිමේන්තු විවාද (හැන්සාර්ඩ්) 2010 ඔක්තෝබර් 10

13 පාර්ලිමේන්තු විවාද (හැන්සාර්ඩ්) ඔක්තෝබර් 10, 2012

**පහත පළවන්නේ මෙම සංශෝධන පනතේ සඳහන් කැපී පෙනෙන වෙනස්කම්වලින් කිහිපයකි**[14]

| වගන්තිය (සංශෝධිත පනතට අනුව) | නව ප්‍රතිපාදන |
|---|---|
| | **ජාතික සීමා නිර්ණය කමිටුව** |
| 3 අ(1) | විෂය භාර අමාත්‍යවරයා විසින් මෙම කමිටුව සඳහා සාමාජිකයන් පස් දෙනෙක් පත් කරනු ලබන අතර ඉන් එක් තැනැත්තෙක් එහි සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතුය. |
| 3 ඉ (1) | **දිස්ත්‍රික් මට්ටමේ සීමා නිර්ණය කමිටුව** |
| | ජාතික නිර්ණය කමිටුවේ විධානය හා අධීක්ෂණය යටතේ ක්‍රියා කළ යුතු මෙම කමිටුව, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අතර එහි සභාපතිවරයා වන්නේ අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්වරයායි. පහත සමාජිකයන් මෙහි නියෝජිතයෝ වෙති. |
| | (අ) මැතිවරණ දෙපාර්තමේන්තුවේ නියෝජිතයකු |
| | (ආ) එකී දිස්ත්‍රික්කය පිහිටා තිබෙන්නේ යම් පළාත් සභාවක සීමාව තුළ ද එකී පළාත් සභාවේ පළාත් පාලන විෂයය භාර අමාත්‍යාංශයේ නියෝජිතයකු |
| | (ඇ) සර්වේ ජෙනරාල් දෙපාර්තමේන්තුවේ නියෝජිතයකු |

[14]මෙම සංශෝධනය 2010 වසරේදී පනත් කෙටුම්පතක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද අවස්ථාවේදී (පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත - 2010 ඔක්. 01 දින) භවානි ෆොන්සේකා, සුපිපි ජයවර්ධන සහ මිරාක් රහීම් යන අයගේ දායකත්වයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ''වගුගත කෙටි විවරණයක්'' ප්‍රකාශයට පත් කරන ලදි. (වසර 2010 ඔක්තෝබර් මස) එහි පනත් කෙටුම්පත මඟින් හඳුන්වාදුන් නව ප්‍රතිපාදන පිළිබඳ විවේචනාත්මක විග්‍රහයක් ඇතුළත් අතර මෙම පනතේ ප්‍රතිපාදන සඳහා ද එහි සමහර කරුණු එලෙසින්ම අදාළ බව සැලකිය යුතුය.

| | |
|---|---|
| | (ඈ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නියෝජිතයකු සහ<br><br>(ඉ) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන රජයේ නිලධරයකු |
| 25 (3)(අ) සහ (ආ) | **කොට්ඨාශ බෙදීමේදී ජාතික කමිටුව සලකා බැලිය යුතු මූලිකාංග** |
| 3 ආ (1) (අ) | (අ) අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ ජනවාර්ගික ජනගහන අනුපාතය සහ ඒ ඒ ජනකොටස්වලට සමාන නියෝජනයක් ලබා දීමට ඇති අවශ්‍යතාව<br><br>(ආ) පළාත් පාලන ආයතනයේ භූගෝලීය ප්‍රදේශය සහ එහි භෞතික ලක්ෂණ<br><br>(ඇ) පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ ජනගහනය සහ එහි ජන ඝනත්වය ; සහ<br><br>(ඈ) පළාත් පාලන ආයතනයේ ආර්ථික සංවර්ධනය<br><br>**මැතිවරණ පරිපාලනය** |
| 8 (i) | පළාත් පාලන ආයතනයක එක් එක් කොට්ඨාශය, අදාළ පළාත් පාලන ආයතනයේ ඡන්ද විමසීමේ කාර්යයේදී ඡන්ද ප්‍රදේශයක් ලෙස සලකනු ලැබේ. |
| 8 (3)(2 අ) | ඡන්ද ප්‍රදේශයක් ඡන්ද දිස්ත්‍රික්ක වලට වෙන්කළ හැකිය. එක් එක් ඡන්ද විමසීම් දිස්ත්‍රික්කයෙහි ඡන්ද දායකයන්ගේ සංඛ්‍යාව එක්දහස් පන්සියකට (1500) නොවැඩි විය යුතුය. සහ |

| | |
|---|---|
| 22 (1) | පළාත් පාලන ආයතන ප්‍රදේශයේ ඕනෑම ඡන්දදායක යෙකුට අපේක්ෂයෙකු විය හැකිය |
| | **නාම යෝජනා පත්‍ර** |
| 25 (3) | යම් අපේක්ෂකයෙක් නාමයෝජනා පත්‍රයක් භාරදීමේදී එම තැනැත්තා තරුණයෙක් නම් නාම යෝජනා පත්‍ර භාරදීමේදී සපුරාලිය යුතු අදාළ කොන්දේසි පැහැර හැර ඇති විටෙක අපේක්ෂකයා නුසුදුස්සෙකු වූ අවස්ථාවකදී, සමස්ත නාමයෝජනා පත්‍රය ප්‍රතික්ෂේප නොවන අතර අදාළ තැනැත්තාගේ නම පමණක් ප්‍රතික්ෂේප වේ. එහෙත් වෙනත් නමක් ආදේශ කළ නොහැකිය. එමෙන්ම ප්‍රතික්ෂේප වූ තැනැත්තාගේ ඇප මුදල ද රාජසන්තක වේ. |
| | **තරුණ අපේක්ෂකයන් සහ කාන්තාවන්** |
| 22 (4), | නාමයෝජනා පත්‍රයේ සඳහන් මුළු අපේක්ෂක සංඛ්‍යාවෙන් සියයට විසිපහක් (25%) කාන්තා හා තරුණයන්ගෙන් සමන්විත **විය හැක**. |
| | **නාමයෝජනා සඳහා තැන්පත් මුදල්** |
| 23 (1) | දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් යන දෙපිරිස ම නාමයෝජනා සඳහා මුදල් තැන්පත් කළ යුතුය. |

| | |
|---|---|
| | දේශපාලන පක්ෂ ඃ<br>නාම යෝජනා පත්‍රයේ එක් නමක් සඳහා රුපියල් පන්දහසක මුදලක් (5000/-)<br><br>ස්වාධීන කණ්ඩායම් ඃ<br>එක් කණ්ඩායමක එක් නමක් සඳහා රුපියල් විසිදහසක (20,000/-) මුදලක් |
| 26 | **නාම යෝජනා කාල සීමාව** |
| | නාම යෝජනා ලබාදීමේ කාල සීමාව දින තුනකි. |
| 29 | **මැතිවරන දිනය** |
| | දැන්වීම පළ කරනු ලැබූ දින සිට සති 5 ට අඩු නොවන සහ සති 6ට වැඩි නොවන කාල සීමාවක් තුළ මැතිවරණ දිනය විය යුතුය. රජයේ නිවාඩු දිනයක් නොවන තාක් දුරට එය සෙනසුරාදා දිනයක් විය හැකිය. |
| | **සාමාන්‍ය ඡන්ද කොට්ඨාශ** |
| 44 | ඡන්ද කොට්ඨාශයේ වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබා ගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට අයත් අපේක්ෂකයා එම ඡන්ද කොට්ඨාශයේ තෝරාගත් සභිකයා ලෙස ප්‍රකාශයට පත් කල යුතුය. |
| | **බහු සභික කාට්ඨාශ** |
| 45 - 1 | දෙවනුවට වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබාගත් පක්ෂයේ අපේක්ෂකයා එම කොට්ඨාශයේ දෙවන සභිකයා ලෙස ද ඉතිරි අයත් එලෙසින් පිළිවෙලට පත් කළ යුතුය. |

| | |
|---|---|
| 45 - 2 | **බහු සභික කොට්ඨාශයක් තුළ තනි දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් පමණක් තරඟ කිරීම**<br>බහු සභික කොට්ඨාශයක් තුළ කවර හෝ යම් හේතුවක් නිසා තනි දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් තරඟ කරනු ලැබුයේ නම් එම පක්ෂයේ ලේකම්වරයා විසින් හෝ ස්වාධීන කණ්ඩායම් නායකයා විසින් ඔවුන් භාරදුන් නාමයෝජනා පත්‍රයේ ඇතුළත් වූ අමතර තැනැත්තන්ගේ ලැයිස්තුවෙන් කෙනෙක් නම් කරනු ලැබේ. |
| 48 | **පුරප්පාඩු පිරවීම**<br>කොට්ඨාශයකින් තෝරාපත් කළ සභිකයන්ගේ පුරප්පාඩු අදාළ දේශපාලන පක්ෂයේ ලේකම්වරයා විසින් පළාත් පාලන ආයතනයේ සභිකයෙකු වශයෙන් තෝරා පත්කරනු ලැබීමට සුදුසුකම් ඇත්තා වූ වෙනත් යම් තැනැත්තෙකු පත් කිරීමෙන් පුරවනු ලැබිය හැක.<br>සමානුපාතික ක්‍රමය යටතේ තේරීපත්වූ සභිකයෙකුගේ යම් පුරප්පාඩුවක් වු විටෙක අදාළ පක්ෂයේ ලේකම්වරයා විසින් අතිරේක ලැයිස්තුවේ ඉතිරි පුද්ගලයෙකු පත් කිරීමෙන් පුරවනු ලැබිය හැක. |
| 48 | **නගරාධිපති හෝ සභාපතිවරයා තෝරාපත් කර ගැනීම**<br>පළාත් පාලන ආයතනයක ආසනවලින් 50% කට වඩා එක් පක්ෂයක් විසින් දිනාගෙන ඇති විට එම පක්ෂයේ ලේකම්වරයා හෝ ස්වාධීන කණ්ඩායමේ නායකයා විසින් සභිකයන් දෙදෙනෙක් නගරාධිපති සහ උප නගරාධිපති හෝ සභාපති සහ උප සභාපති ලෙස නම් කරනු ඇත.<br>ඉහත තනතුරු පුරප්පාඩු වනවිට පක්ෂ ලේකම්වරයා හෝ කණ්ඩායම් නායකයා දෙවැන්නෙකු ඒ සඳහා නම් කරනු ඇත. |

**පසු සටහන් ඃ**

**ඉහත කෙටි සටහනට අමතරව පහත සඳහන් කොමිෂන් සභා වාර්තා පර්යේෂණ ග්‍රන්ථ / වාර්තා පරිශීලනය කිරීම තුළින් ද මෙම සංශෝධනවල පසුබිම පිළිබඳ වැඩිදුර හැදෑරිය හැකිය.**

- පළාත් පාලන ප්‍රතිසංස්කරණ පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාවඃ අංක 01 දරන සැසිවාර්තාව - 1999 සැප්තැම්බර්. පළාත් පාලන ක්ෂේත්‍රය පිළිබඳව මෙතෙක් සම්පාදනය වී ඇති ප්‍රශස්තම කොමිෂන් සභා වාර්තාව මෙය වන අතර එහි 16 වැනි කොටසේ පළාත් පාලන මැතිවරණ ක්‍රමය පිළිබඳ ඉතා පුළුල් විග්‍රහයක් කර ඇත. එහි වර්තමානයේ පවත්නා “පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ ආඥාපනත” අවලංගු කර සුළු නගර සභා හා ගම් සභා පැවති අවධියේ තිබූ “පළාත් පාලන ඡන්ද විමසීම් පනත” අවශ්‍ය සංශෝධන සහිතව යළිත් ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම අවධාරණය කර ඇත.

- අසංග වැලිකල හා රොහාන් එදිරිසිංහ යන දෙදෙනා විසින් සංස්කරණය කරන ලද “ශ්‍රී ලංකාවේ මැතිවරණ ප්‍රතිසංස්කරණය පිළිබඳ සංවාදය” (The Electoral Reform Debate in Sri Lanka - 2008) යන ග්‍රන්ථයද පළාත් පාලන ආයතන ඇතුළු සමස්ත මැතිවරණ ක්‍රියාදාමයේ සිදුවිය යුතු ඵලදායී ප්‍රතිසංස්කරණ පිළිබඳ අවධානය යොමු කර ඇත. එහි දැක්වෙන පහත සඳහන් ඇමිණුම් කෙරෙහි අවධානය යොමු කිරීම ඉතා වැදගත්ය.

  ඇමිණුම් අංක - 3, “සංවාදයෙන් ක්‍රියාකාරීත්වයට සහ ශ්‍රී ලංකාවේ මැතිවරණ ප්‍රතිසංස්කරණ සඳහා උපායමාර්ග” Annexture 3 - From Dialogue to Action Reccomendations and Strategies for Electoral Reform in Sri Lanka (PAFFRAL and CMEV), 2004 දෙසැම්බර් මස එළිදැක්වූ මෙය භාෂාත්‍රයෙන්ම වෙනම ග්‍රන්ථයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

  ඇමිණුම් අංක - 4, “2006 ජූලි මස 21 වැනි දින මැතිවරණ ප්‍රතිසංස්කරණ පිළිබඳ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව වෙත විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඉදිරිපත් කරන ලද යෝජනා / නිර්දේශ මාලාව” Annexture 4 - Presentation by the Centre for Policy Alternatives (CPA) to the Select Committee of Parliament on Electoral Reforms, 21st July 2006

කාණ්ඩ දෙකකින් යුත් මෙම සංෂිප්ත විග්‍රහය, පළාත් පාලන ආයතන සඳහා තේරීපත් වී ඇති මහජන නියෝජිතයන්ගේ සහ නිළධාරින්ගේ එදිනෙදා ආයතනික කටයුතු සඳහා වැදගත් වන සංශෝධන පිළිබඳ පවතින සංවාදය සඳහා දායක වීමටත්, ඔවුන්ගේ දැනුම වඩාත් වර්ධනය කිරීම සඳහාත් දරණ ලද සාමුහික උත්සහයක ප්‍රතිඵලයකි. මෙය පළාත් පාලන ආයතනවල විශේෂයෙන් ම ප්‍රාදේශීය සභාවල කාර්යභාරය ශක්තිමත් කිරීමට ඉහවල් වනු ඇතැයි, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ යහපාලන වැඩසටහන විශ්වාස කරනු ලබන අතර එය සමස්තයක් ලෙස ප්‍රජාවට ප්‍රතිලාභයක් වන අතර ජනතාවට වඩාත් සමීපත ම ප්‍රාදේශීය මට්ටමේ, නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්ධනයට ද හේතුවේ.